පූජ්‍ය ඉලුක්කේවෙල ධම්මරතන හිමි
ශාස්ත්‍රවේදී (ගෞරව), ශාස්ත්‍රපති, දර්ශනපති
බෞද්ධ දර්ශනය අධ්‍යයනාංශය
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## සර්වාස්තිවාදය සහ ථෙරවාදය අතර පවත්නා සමවිසම තා පිළිබඳ හැඳින්වීමක්

ආභිධර්මික ඉගැන්වීම් සංවර්ධනය වීමෙහි ලා සුවිශේෂී කාර්ය භාරයක් ඉටුකළ බෞද්ධ සම්ප්‍රදාය දෙකක් ලෙස ථෙරවාදය සහ සර්වාස්තිවාදය හඳුන්වාදිය හැකිය. ථෙරවාදය පාලි භාෂාව ප්‍රධාන භාෂාව ලෙස සැලකූ අතර ස්ර්වාස්තිවාදය සංස්කෘත භාෂාවට එම ස්ථානය ලබා දුණි. මථුරාවේදී ප්‍රභවය වූ සර්වාස්තිවාද සම්ප්‍රදාය ක්‍රමයෙන් ගන්ධාර සහ කාෂ්මීර ප්‍රදේශයන්හි දී හොඳින් පෝෂණය විය. කණිෂ්ක රජතුමාගේ රාජ්‍ය අනුගහය හේතුවෙන් මෙම සම්ප්‍රදාය මධ්‍ය ආසියාව, චීනය ඇතුලු බොහෝ රටවලට සම්ප්‍රේෂණය විය. සර්වාස්තිවාදය චීනයට ගමන් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස එතෙක් සංස්කෘත භාෂාවෙන් පැවති බොහෝ ග්‍රන්ථ චීන භාෂාවට පරිවර්තනය විය. මගධයේ දී ප්‍රභවය වූ ථෙරවාද සම්ප්‍රදාය පැළලුප්නුවර දී සංවර්ධනය වී ශ්‍රී ලංකාව, මියන්මාරය, තායිලන්තය, කැන්බෝඩියාව සහ ලාඕසය යන රටවලට ව්‍යාප්ත විය. සූත්‍ර, විනය සහ අභිධර්මය යන ත්‍රිපිටකය මෙම සම්ප්‍රදායයන් විසින් අවිවාදයෙන් පිළිගත්ත ද අන්තර්ගතයෙහි සුවිශේෂී වෙනස්කම් රැසක් දක්නට ඇත. ධර්මයන්හි පවත්නා සූක්ෂම ධර්ම කොටස් අතීත, වර්තමාන සහ අනාගත වශයෙන් පවත්නා බව සර්වාස්තිවාදීහු පිළිගත්ත ද ථෙරවාදීහු එය නො පිළිගනිති.

### සූත්‍ර පිටකය

ථෙරවාද සම්ප්‍රදායාගත සූත්‍රපිටකයට අයත් ග්‍රන්ථ හඳුන්වන නාමය 'නිකාය' යන්න වුව ද සර්වාස්තිවාදයෙහි ඒ සඳහා භාවිත නාමය 'ආගම' යන්න වේ. එනම්ඃ

01. දීර්ඝාගම
02. මජ්ඣිමාගම
03. සංයුක්තාගම
04. එකොත්තරාගම
05. ක්ෂුද්‍රකාගම

සූත්‍රපිටකයට අයත් ග්‍රන්ථ ලෙස මුල් ආගම ග්‍රන්ථ හතර දක්වා ඇතත් ක්ෂුද්‍රකාගමය සූත්‍රපිටකයෙහිලා නො ගැනේ. නමුත් කෝෂ ග්‍රන්ථයෙහි ක්ෂුද්‍රක යන්න භාවිත හෙයින් ක්ෂුද්‍රකාගම ග්‍රන්ථය පැවති බව ද පිළිගත හැකිය.

ථෙරවාද සම්ප්‍රදායට අයත් සූත්‍ර පිටකාගත නිකාය ග්‍රන්ථ පහකි.

01. දීඝනිකාය
02. මජ්ඣිමනිකාය
03. සංයුත්තනිකාය
04. අංගුත්තරනිකාය
05. ඛුද්ධකනිකාය

චීන භාෂාවට පරිවර්තනය කොට ඇති ආගම ග්‍රන්ථ හා පාලි භාෂාවෙන් රචිත ථෙරවාද නිකාය ග්‍රන්ථ පිළිබඳ සංසන්දනයක යෙදෙන මහාචාර්ය අකනුමා ඒවා අතර පවත්නා සමවිසම තා කිහිපයක් පෙන්වා දෙයි. පාලි සම්ප්‍රදායට අයත් දීඝ නිකායෙහි සූත්‍ර 34 ක් දක්නට ඇතත් දීර්ඝාගමයෙහි දක්නට ඇත්තේ සූත්‍ර 30 ක් පමණක් වන බවත් දීඝ නිකායෙහි ප්‍රථම භාගයෙහි සූත්‍ර 13 ඇතත් දීර්ඝාගමයෙහි ප්‍රථම භාගයෙහි ඇත්තේ සූත්‍ර 10 ක් පමණි. මහාලි, ජාලිය, සුබ යන සූත්‍ර තුන ඉන් ඉවත්ව ඇති බවත් එතුමා පෙන්වා දෙයි. පාලි සම්ප්‍රදායට අයත් මජ්ඣිමනිකායට අයත් සූත්‍ර සංඛ්‍යාව 152 කි. එයින් සූත්‍ර 19 ක් මජ්ඣිමාගමයෙහි දක්නට නැත. එම සූත්‍ර නම්ඃ

1. චූළසාරොපම
2. මහාසච්චක
3. සාලෙය්‍යක
4. වේරඤ්ජක
5. කන්දරක
6. ජීවක
7. කුක්කුරවතිය
8. අභයරාජකුමාර
9. අපණ්ණක
10. තෙවිජ්ජවච්ඡගොත්ත
11. ඝොටමුඛ
12. චඞ්කී
13. වාසෙට්ඨ
14. සංගාරව
15. පඤ්චත්තය
16. කින්ති
17. සුනක්ඛත්ත
18. අනුපද
19. භද්දේකරත්ත

පාලි සම්ප්‍රදායාගත අංගුත්තර නිකායට අයත් සූත්‍ර 82 ක් ද, සංයුත්ත නිකායට අයත් සූත්‍ර 10 ක් ද, දීඝ නිකායට අයත් සූත්‍ර 9ක් ද අන්තර්ගත ව ඇති මජ්ඣිමාගමයෙහි දක්නට ඇති සමස්ථ සූත්‍ර සංඛ්‍යාව 222 කි. සමස්ථයක් වශයෙන් බලන විට පාලි සම්ප්‍රදායට අයත් සූත්‍ර කිහිපයක් ආගම ග්‍රන්ථයන්හි දන්නට නොලැබෙන අතර ථෙර-ථෙරී ගාථාවල හා විනයෙහි ඇති ඇතැම් දේශනා ද ආගම ග්‍රන්ථයන්හි දක්නට ලැබේ.

සංයුක්තාගම සහ සංයුත්තනිකාය අතර පවත්නා සමවිසම තා පිළිබඳව අවධානය යොමු කිරීමේ දී පිටක දෙකෙහි ම සගාතක වග්ගය සමාන බව වුවත් ආගම ග්‍රන්ථයෙහි එන නිධානවග්ගයෙහි විසමතා කිහිපයක් දක්නට ලැබේ. අටවන සහ නවවන පරිච්ඡේද වන සමණබ්‍රාහ්මණ සහ අන්තරාපෙය්‍යාල එහි දන්නට නොලැබේ. එමෙන් ම පළමු සහ පස්වන පරිච්ඡේද වන බුද්ධවග්ගයෙහි සහ ගහපතිවග්ගයෙහි ද විශේෂ වෙනස් කම් දක්නට ඇත. එම පරිච්ඡේදයෙහි ම අභිසමය, ධාතු සහ අනෙක් සංයුත්තයන්හි ද බොහෝ අසමානතා වේ. කෙසේ වුව ද අනමතග්ග,

කස්සප, ලක්ඛණ, ඔපම්මක සහ භික්ඛු යන වග්ග නිකාය ග්‍රන්ථ හා බොහෝ සෙයින් සමාන ය. ආගම ග්‍රන්ථයෙහි එන ඛන්ධ වග්ගයෙහි ඔක්කන්ති, උප්පාද, කිලේස, සාරිපුත්ත, නාග, ගන්ධබ්බ, වලාහක, වච්ඡගොත්ත සහ ඣාන සංයුත්ත දක්නට නො ලැබේ. සළායතන වග්ගයෙහි මාතුගාම, මොග්ගල්ලාන සහ අසංඛත සංයුත්ත දක්නට නොලැබේ. මහාවග්ගයෙහි මග්ග, ඉන්ද්‍රිය, සම්මප්පධාන, බල, ඉද්ධිපාද සහ සච්ච සංයුත්ත ද දක්නට නො ලැබේ.

චීන පරිවර්තනයට අනුව සංයුක්තාගමය වර්ග 50 කට බෙදා ඇත. අංගුත්තරනිකායට සහ වෙනත් නිකායන්ට අයත් සූත්‍ර කිහිපයක් ද මෙහි දක්වා ඇත. එසේ ම පාලි නිකායෙහි දක්නට නැති සූත්‍ර කිහිපයක් ද මෙහි දක්වා ඇත. අංගුත්තර නිකායට අයත් කෝකනද, අනාථපිණ්ඩික, සාරබ්භ, පරිව්‍රාජක-ස්ථවිර, බ්‍රාහ්මණසත්‍යානි සූත්‍ර ද, මජ්ඣිම නිකායට අයත් දීඝනඛ සූත්‍රය ද චීන පරිවර්තනයෙහි සංයුක්තාගමයෙහි දන්නට ඇත.

ඒකෝත්තරාගමය සහ අංගුත්තරනිකාය අතර සමානතා දන්නට ලැබෙන්නේ ඉතා ස්වල්ප වශයෙනි. ඒ සඳහා හේතු වී ඇත්තේ මධ්‍යමාගමයෙහි සහ සංයුක්තාගමයෙහි බොහෝ සෙයින් සූත්‍ර ඇතුලත් කොට තිබීමයි. සමචිත්ත, දේවදූත, බ්‍රාහ්මණ වග්ගයේ සිට ලෝණඵල වගග්ය දක්වා, චක්ක, මුණ්ඩරාජ, නිවාරණ, ආඝාත, දේවතා වග්ගයේ සිට මහා වග්ගය දක්වා, අව්‍යාකත වග්ගයේ සිට මහා වග්ගය දක්වා, ගහපති වග්ගය, සචිත්ත, උපාසක, ජානුස්සෝණි සහ අනුස්සති යන වග්ග සමානතා අතර වේ.

ථෙරවාදයට අයත් ඛුද්දක නිකාය සූත්‍ර සංග්‍රහයක් නොවන අතර එය ග්‍රන්ථ එකතුවකි. ඒ අනුව ඛුද්ධකනිකායට අයත් පොත් සංඛ්‍යාව 15 කි.

01. ඛුද්දකපාඨ
02. ධම්මපද පාළි
03. උදාන පාළි
04. ඉතිවුත්තක පාළි
05. සුත්තනිපාත
06. විමානවත්ථු පාළි
07. පේතවත්ථු පාළි
08. ථෙරගාථා පාළි
09. ථෙරීගාථා පාළි
10. ජාතක පාළි
11. නිද්දෙස පාළි
12. පටිසම්භිදාමග්ගප්පකරණ
13. අපදාන පාළි
14. බුද්ධවංස පාළි
15. චරියාපිටක පාාළි

සර්වාස්තිවාද සූත්‍ර පිටකයෙහි මෙවැනි නිකායක් දක්නට නැතත් උදානවග්ගය, සූත්‍ර නිපාතය (අට්ඨක සහ පාරායන වග්ග), ස්ථවිර ගාථා, ධර්මපද, විමානවස්තු, සහ බුද්ධවංශ වශයෙන් පසුකාලීනව එකතු කළ කෘති ක්ෂුද්‍රකාගම ලෙස සැලකේ.

**විනය පිටකය**

සර්වාස්තිවාදයට අයත් විනය ග්‍රන්ථ සංඛ්‍යාව හතකි.

1. සර්වාස්තිවාද විනය මාතෘකා (පරිවර්තනය - සංඝවර්මන් ක්‍රි.ව. 445)
2. සර්වාස්තිවාද විනය විභාෂා (පරිවර්තනය - අඥාතයි ක්‍රි.ව. 350-431)
3. සර්වාස්තිවාද විනය සංග්‍රහය (සම්පාදනය - ජිනමිත්‍ර, පරිවර්තනය අයි-ඉට්සිංග් ක්‍රි.ව. 700)
4. දශාධ්‍යාය-විනය-නිධානය (පරිවර්තනය - විමලාක්ෂ)
5. දශාධ්‍යාය-විනය-භික්ෂු-ප්‍රාතිමෝක්ෂය (පරිවර්තනය - කුමාරජීව ක්‍රි.ව. 404)
6. දශාධ්‍යාය-විනය-භික්ෂුණී-ප්‍රාතිමෝක්ෂය (සම්පාදනය - ෆායින් ක්‍රි.ව. 420-479)
7. දශාධ්‍යාය-විනය හෙවත් සර්වාස්තිවාද විනය (පරිවර්තනය - පුණ්‍යතර සහ කුමාරජීව ක්‍රි.ව. 404)

ථෙරවාද සම්ප්‍රදායට අයත් විනය පිටකයෙහි මූල ග්‍රන්ථ පහකි.

1. පාරාජිකා පාළි
2. පාචිත්තිය පාළි
3. මහාවග්ග පාළි
4. චුල්ලවග්ග පාළි
5. පරිවාර පාළි

සර්වාස්තිවාදීන්ගේ ප්‍රධානතම විනය ග්‍රන්ථය දශාධ්‍යාය විනය යි. එහි පරිච්ඡේද 14කි. ඉන් ආරම්භයේ සිට පරිච්ඡේද අටක් ප්‍රාතිමෝක්ෂ සූත්‍ර සඳහා වෙන් කොට ඇත. නවවන පරිච්ඡේදයෙහි ශික්ෂාපද, පෝෂධ, පාපදේශනා, වර්ෂාවාස, චර්මවස්තු, භයිෂජ්‍යවස්තු සහ චීවර වශයෙන් ධර්ම හතක් දක්වා ඇත. දහවන පරිච්ඡේදයෙහි කඨින, කෞෂාම්බි, චම්පා, පාණ්ඩුලෝහිතක, සංඝාවශේෂ-පරිවාස, පටිච්ඡාදන, ශායනාසන සහ ආසමුදාචාරික-ධර්ම වශයෙන් ධර්ම හතක් දක්වා ඇත. එකළොස්වන පරිච්ඡේදය සංයුත්ත නමින් දක්වා විවිධ ශික්ෂාපද, විනය නීති සහ භික්ෂු ජීවිතයට අදාළ වෙනත් ශික්ෂාපද දක්වා ඇත. දොළොස්වන පරිච්ඡේදය භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය ලෙස දක්වා පාරාජිකා 8, සංඝාවශේෂ 17, නිඃසර්ගිකා 30, පායන්තික 78, ප්‍රාතිදේශනීය 8 සහ අෂ්ට ධර්ම සඳහන් කොට ඇත. දහතුන්වන පරිච්ඡේදයේ දී උක්ත නීති ඒකෝත්තරාගම ක්‍රමය අනුගමනය කරමින් එකේ සිට එකොළහ දක්වා පිළිවෙළින් ඇතුලත් කොට ඇත. දාහතරවන පරිච්ඡේදයෙහි විනය නීති පිළිබඳ වන උපාලි පරිපෘච්ඡා නම් ග්‍රන්ථය ඇතුලත් කොට ඇත. ථෙරවාදයෙහි සහ මූල සර්වස්තිවාදයෙහි එන සියලු පරිච්ඡෙද මෙහි ඇතුළත් වීම විශේෂ යි.

**අභිධර්ම පිටකය**

වෛභාෂිකයන්ට අයත් අභිධර්ම විභාෂා ශාස්ත්‍ර ග්‍රන්ථ හත හැරුණුවිට වසුබන්ධු, සංඝභද්‍ර, ධර්මත්‍රාත සහ ධර්මෝත්තර විසින් රචිත දාර්ශනික ග්‍රන්ථ හේතුවෙන් සර්වාස්තිවාදයට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. අභිධර්මකෝෂය, අභිධර්මකෝෂභාශ්‍ය සහ යශෝමිත්‍රගේ අභිධර්මකෝෂව්‍යාක්‍යාව හැර වෙනත් කිසිදු ග්‍රන්ථයක් සංස්කෘත භාෂාවෙන් දක්නට නොමැත. සර්වාස්තිවාදයට අයත් අභිධර්ම ග්‍රන්ථ සංඛාව හතකිඃ

1. ඥානප්‍රස්ථාන (ආර්ය කාත්‍යායනීපුත්‍රගේ)

2. ප්‍රකරණපාද (ස්ථවිර වසුමිත්‍ර)
3. විඥානකාය (ස්ථවිර දේවශර්මා)
4. ධර්මස්කන්ධ (ආර්ය ශාරිපුත්‍ර)
5. ප්‍රඥප්තිශාස්ත්‍ර (ආර්ය මෞද්ගල්‍යායන)
6. ධාතුකාය (පුරාණ)
7. සංගීතිපර්යාය (මහාකෞෂ්ඨිල)

අභිධර්මකෝෂයෙහි සඳහන් වන පරිදි ඥානප්‍රස්ථානයෙහි කර්තෘත්වය හිමිවන්නේ බුදුරජාණන් වහන්සේට ය. නමුත් එහි පරිච්ඡේද සහ මාර්තෘකා දැක්වීම සිදු කරන ලද්දේ කාත්‍යායණීපුත්‍ර හිමියන් විසින් බැවින් එහි කර්තෘත්වය උන්වහන්සේට හිමිව ඇත.

සර්වාස්තිවාද සම්ප්‍රදාය තුළ දක්නට ලැබෙන සුවිශේෂී ධර්ම කොට්ඨාසයකි චිත්ත-විප්‍රයුක්ත-ධර්ම. ථෙරවාදී සම්ප්‍රදාය තුළ මෙම ධර්ම කොට්ඨාසය දක්නනට නො ලැබුණ ද ඒවා ප්‍රභවය වීමෙහිලා ථෙරවාදී අභිධර්මය ඉවහල් වූ බව බොහෝ අයගේ අදහසයි.

සර්වාස්තිවාදයට අයත් වසුබන්ධු විසින් රචනා කරන ලද **අභිධර්මකෝශභාෂ්‍යය** නම් ග්‍රන්ථයත් යශෝමිත්‍ර විසින් රචනා කරන ලද **ස්ඵුඨාර්ථය** නම් ග්‍රන්ථයත් මේ පිළිබඳව කරුණු දක්වන මූලාශ්‍ර වේ. **මැක්ගවර්න්** (McGovern), **ස්ට්වෙබර්ට්ස්කි** (Stchebertsky) සහ **පී. එස්. ජයිනි** (P.S. Jaini) යන අය මේ පිළිබඳ ව කරුණු අධ්‍යයනය කර ඇත.

ථෙරවාදී අභිධර්මය පිළිබඳ බොහෝ දෙනා උනන්දුවක් දක්වන හෙයින් ඒ පිළිබඳ වැඩි විස්තරක් කිරීමට මෙහි දී අපේක්ෂා නො කරන අතර සර්වාස්තිවාද අභිධර්මය පිළිබඳ ව වැඩි විස්තරයක් දැක්වීමට අපේක්ෂා කරමු. සර්වාස්තිවාද අභිධර්මයට අයත් ධර්මයෝ හැත්තෑපහකි (75).

1. **රූප** 11 - (1) චක්ෂුර්-ඉන්ද්‍රිය, (2) ශ්‍රෝත්‍ර-ඉන්ද්‍රිය, (3) ඝ්‍රාණ-ඉන්ද්‍රිය, (4) ජිව්හා-ඉන්ද්‍රිය, (5) කාය-ඉන්ද්‍රිය, (6) රූප-ඉන්ද්‍රිය, (7) ශබ්ද-ඉන්ද්‍රිය, (8) ගන්ධ-ඉන්ද්‍රිය, (9) රස-ඉන්ද්‍රිය, (10) ස්පර්ෂ්ඨව්‍යාර්ථ, (11) අවිඥප්ති-රූප
2. **චිත්ත** 01 - (12)
3. **චෛතසික** 46
   - i. **මහාභූමික ධර්ම** 10 - **(13) වේදනා, (14) චේතනා, (15) සංඥා, (16) ඡන්ද, (17) ස්පර්ෂ, (18) ප්‍රඥා, (19) ස්මෘති, (20) මනසිකාර, (21) අධිමෝක්ෂ, (22) සමාධි**
   - ii. **කුශල**-**මහාභූමික ධර්ම** 10 - **(23) ශ්‍රද්ධා, (24) අප්‍රමාද, (25) ප්‍රශබ්ධි, (26) උපේක්ෂා, (27) හිරි, (28) අපත්‍රාප්‍ය, (29) අලෝභ, (30) අද්වේෂ, (31) අවිහිංසා, (32) වීර්ය**
   - iii. **කෙල්ෂ-මහාභූමික ධර්ම** 6 - (33) මෝහ, (34) ප්‍රමාද, (35) කෞශීද්‍යය, (36) ආශ්‍රද්ධ්‍යය, (37) ස්ත්‍යාන, (38) ඖධිත්‍යය
   - iv. **අකුශල**-**මහාභූමික ධර්ම** 2 - (39) ආහ්‍රීක්‍යය, (40) අනපත්‍රාප්‍යය
   - v. **පරීත්තකෙල්ෂ-භූමික ධර්ම** 10 - (41) ක්‍රෝධ, (42) උපනාහ, (43) ශාධ්‍යය, (44) ඊර්ෂ්‍යා, (45) ප්‍රදාශ, (46) ම්‍රක්ෂ්‍යය, (47) මාත්සර්ය, (48) මායා, (49) මද, (50) විහිංසා

| | | |
|---|---|---|
| vi. **අනියත ධර්ම** 8 | - | (51) කෞකෘත්‍ය, (52) මිද්ධ, (53) විතර්ක, (54) විචාර, (55) රාග, (56) ප්‍රතිඝ, (57) මාන, (58) විචිකිත්සා |
| 4. **චිත්තවිප්‍රයුක්ත ධර්ම** 14 | - | (59) ප්‍රාප්ති, (60) අප්‍රාප්ති, (61) නිකායසභාග, (62) ආසංඥික, (63) ආසංඥී-සමාපත්ති, (64) නිරෝධ-සමාපත්ති, (65) ජීවිතේන්ද්‍රිය, **(66) ජාති-ලක්‍ෂණ, (67) ස්ථිති-ලක්‍ෂණ, (68) ජරා-ලක්‍ෂණ, (69) අනිත්‍යතා-ලක්‍ෂණ, (70) නාම-කාය, (71) පද-කාය, (72) ව්‍යංජන-කාය** |
| 5. **අසංස්කෘත ධර්ම** 3 | - | **(73) ආකාශ, (74) ප්‍රතිසංඛ්‍යා-නිරෝධ, (75) අප්‍රතිසංඛ්‍යා-නිරෝධ** |

චිත්තවිප්‍රයුත්ත ධර්ම සම්බන්ධයෙන් සර්වාස්තිවාදී සම්ප්‍රදාය තුළ ද ඒකමතිකත්වයක් දක්නට නො ලැබෙයි. එනිසා ම ඒ පිළිබඳ විවිධ අර්ථවිවරණ අපට හමුවේ.

1. මුල් බුදුසමය තුළ හමුවන පඤ්චස්ඛන්ධය පිළිබඳ ඉගැන්වීම සාරිපුත්‍රාභිධර්ම නම් ග්‍රන්ථයේ දී චිත්ත-සම්ප්‍රයුක්ත සහ චිත්ත-විප්‍රයුක්ත වශයෙන් දක්වා ඇත්තේ මෙසේය.

   i. චිත්ත-සම්ප්‍රයුක්ත ධර්ම
   ii. චිත්ත-සම්ප්‍රයුක්ත නො වන ධර්ම
   iii. චිත්ත-සම්ප්‍රයුක්ත හෝ චිත්ත-සම්ප්‍රයුක්ත හෝ නො වන ධර්ම
   iv. එක්කෝ චිත්ත-සම්ප්‍රයුක්ත වන නැත්නම් චිත්ත-සම්ප්‍රයුක්ත නො වන ධර්ම

1. පඤ්චස්කන්ධයට අයත් ස්කන්ධ ධර්ම පහත දැක්වෙන පරිදි කොටස් හතරකට බෙදේ.

   i. රූප-ස්කන්ධය - **චිත්ත-සම්ප්‍රයුක්ත නොවන** ධර්මය
   ii. වේදනා-ස්කන්ධය, සංඥා-ස්කන්ධය - **චිත්ත-සම්ප්‍රයුක්ත වන** ධර්ම
   iii. විඥාන-ස්කන්ධය - **චිත්ත-සම්ප්‍රයුක්ත වන හෝ චිත්ත සම්ප්‍රයුක්ත නොවන හෝ** නො වන ධර්මය
   iv. සංස්කාර-ස්කන්ධය -එක්කෝ **චිත්ත-සම්ප්‍රයුක්ත වන** නැත්නම් **චිත්ත සම්ප්‍රයුක්ත නොවන** ධර්මය (චිත්ත-සම්ප්‍රයුක්ත නො වන සංස්කාර ස්කන්ධයෝ නම් 'ජාති' සිට 'නිරෝධ සමාපත්ති' දක්වා ගැනෙන චෛතසික)

2. **චිත්ත-සම්ප්‍රයුක්ත නොවන** ධර්මයක් වශයෙන් හෝ **චිත්ත-විප්‍රයුක්ත සංස්කාර** ධර්මයක් වශයෙන් හෝ සංස්කාර-ස්කන්ධය සැලකිය නො හැකි බව **සාරිපුත්‍රාභිධර්ම** ග්‍රන්ථය සඳහන් කරයි. එහි දී ධර්මායතන යන්න කොටස් දෙකකට බෙදිය හැකි බව දක්වයි. එනම් **චිත්ත-සම්ප්‍රයුක්ත** හා **චිත්ත-සම්ප්‍රයුක්ත නොවන** ධර්ම වශයෙනි. එහි දී 'වේදනා, සංඥා' ආදී වශයෙන් 'ක්ලේෂ' (ක්ලේෂ මහාභූමික) දක්වා (දහතුනේ (13) සිට තිස්දෙක (32) දක්වා) ගැනෙන **තද කලු අකුරින් මුද්‍රිත** සියලු චෛතසික ධර්මයෝ චිත්ත-සම්ප්‍රයුක්ත ධර්ම යනුවෙන් හඳුන්වා දෙයි. '**ජාති**', ආදී වශයෙන් '**අප්‍රතිසංඛ්‍යා-නිරෝධ**' දක්වා ගැනෙන තද කලු අකුරින් මුද්‍රිත සියලු චෛතසික ධර්ම (හැටහයේ (66) සිට අවසනට (75)) චිත්ත-සම්ප්‍රයුක්ත නොවන ධර්ම වශයෙන් හඳුන්වා දෙයි.

3. **අභිධර්මප්‍රකරණශාස්ත්‍ර** නම් ග්‍රන්ථයේ **චිත්ත-විප්‍රයුක්ත සංස්කාර** යන්න පාරිභාෂික වචනයක් වශයෙන් දක්වා ඇත. එහි දී චිත්ත-විප්‍රයුක්ත-ධර්ම යනු **චෛතසික** නො වන බවත් එය **රූප, අසංස්කෘත හා චිත්ත-විප්‍රයුක්ත-සංස්කාර** වන බවත් දක්වා ඇත.

4. **ඥානප්‍රස්ථාන-ශාස්ත්‍ර** නම් ග්‍රන්ථයේ විපාක හේතු නම් පරිච්ඡේදයේ දී චිත්ත-විප්‍රයුක්ත-සංස්කාර පිළිබඳ ව පළමුවරට දක්වා ඇත. එහි දී රූප, චිත්ත සහ චෛතසික යන්න චිත්ත-විප්‍රයුක්ත-සංස්කාර වශයෙන් සිදු කරන ලද වර්ගීකරණයක් ලෙස දක්නට ලැබේ. අරූපාවචර බ්‍රහ්ම ලෝකයෙහි උපදින සත්ත්වයන්ගේ මානසික ක්‍රියාවලිය ජීවිතින්ද්‍රිය, නිකාය-සභාග සහ අනෙකුත් චිත්ත-විප්‍රයුක්ත-සංස්කාර පදනම් කරගනිමින් පැහැදිලි කරයි.

5. **වසුමිත්‍ර** විසින් රචිත **පංචවස්තුක** නම් ග්‍රන්ථයේ දී සියලු ධර්මයන් කොටස් පහකට බෙදා දක්වා ඇත.

   i. රූප
   ii. චිත්ත
   iii. චෛසික
   iv. චිත්ත-විප්‍රයුක්ත-සංස්කාර
   v. අසංස්කෘත

   මෙහි දී **චිත්ත-විප්‍රයුක්ත-සංස්කාර** යනු **චිත්ත-සම්ප්‍රයුක්ත නොවන ධර්ම** බව දක්වා ඇත. එනම්ඃ

   1. ප්‍රාප්ති
   2. අසංඥී සමාපත්ති
   3. නිරෝධ සමාපත්ති
   4. ආසංඥික
   5. ජීවිතේන්ද්‍රිය
   6. නිකාය-සභාග
   7. උපධි-ප්‍රතිලම්භ
   8. වස්තු-ප්‍රතිලම්භ
   9. ආයතන-ප්‍රතිලම්භ
   10. ජාති
   11. ස්ථිති
   12. ජරා
   13. අනිත්‍යතා
   14. නාම-කාය
   15. පද-කාය
   16. ව්‍යංජන-කාය

වශයෙන් ගැනෙන **චිත්ත-සම්ප්‍රයුක්ත** නොවන ධර්ම සියල්ල **චිත්ත-විප්‍රයුක්ත-සංස්කාර** ලෙස දක්වා ඇත.

6. **අභිධර්මකෝශභාෂ්‍ය** නම් ග්‍රන්ථයේ දී චිත්ත-විප්‍රයුක්ත ධර්ම 14ක් දක්වා ඇත. එනම්ඃ

    1. ප්‍රාප්ති (1)
    2. අප්‍රාප්ති
    3. නිකාය-සභාග (6)
    4. ආසඤ්ඤික (4)
    5. ආසඤ්ඤී-සමාපත්ති (2)
    6. නිරෝධ-සමාපත්ති (3)
    7. ජීවිතින්ද්‍රිය (5)
    8. ජාති-ලක්‍ෂණ (10)
    9. ස්ථිති-ලක්‍ෂණ (11)
    10. ජරා-ලක්‍ෂණ (12)
    11. අනිත්‍යතා-ලක්‍ෂණ (13)
    12. නාම-කාය (14)
    13. පද-කාය (15)
    14. ව්‍යංජන-කාය (16)

7. **පංචවස්තුක** නම් ග්‍රන්ථයේ දක්වා ඇති ධර්ම දහසයෙන් (16) ධර්ම දහතුනක් (13) **අභිධර්මකෝශභාෂ්‍යය** නම් ග්‍රන්ථයේ දක්නට ලැබෙ යි. එහි දක්නට නො ලැබෙන ධර්ම තුන නම්ඃ

    i. උපධි-ප්‍රතිලම්භ
    ii. වස්තු-ප්‍රතිලම්භ
    iii. ආයතන-ප්‍රතිලම්භ

8. **පංචවස්තුක** නම් ග්‍රන්ථයේ දක්නට ලැබෙන ධර්මයක් වන **අප්‍රාප්තිය අභිධර්මකෝශභාෂ්‍යය** නම් ග්‍රන්ථයේ දක්වා ඇත.
9. රූප ස්වභාවයෙන් යුක්ත නො වන, මනස සමඟ ද නො යෙදෙන, සංස්කාරස්කන්ධයට ද අයත් යම් ධර්මයක් වේද එය චිත්තවිප්‍රයුක්තසංස්කාර නම් වන බව ආචාර්ය වසුබන්ධු පෙන්වා දෙයි.

**ධර්ම**

ථෙරවාදය සහ සර්වාස්තිවාදය අතර පවත්නා සුවිශේෂී වෙනස නම් ධර්මයන්හි පැවැත්ම පිළිබඳ මතය යි. පංච ධර්මයන් ඒවායෙහි සූක්‍ෂම අවස්ථාවේදී අතීත, වර්තමාන සහ අනාගත වශයෙන්

පවත්නා බව සර්වාස්තිවාදීහු පිළිගනිති. නමුත් ථෙරවාදීහු එවැනි පැවැත්මක් පිළි නොගනී. එම පංච ධර්මයෝ නම්ඃ චිත්ත, චෛතසික, රූප, විසම්ප්‍රයුක්ත-සංස්කාර සහ අසංකෘත යි. මෙම ධර්ම පහ චිත්ත (1), චෛතසික (46), රූප (11), විසම්ප්‍රයුක්ත-සංස්කාර (14), අසංස්කෘත (3) වශයෙන් සූක්‍ෂම ධර්ම 75 කට බෙදා දක්වා ඇත.

ථෙරවාදයේ දී පංචස්කන්ධ ධර්මයන් සතර පරමාර්ථ ධර්ම ඇසුරෙන් විග්‍රහ කරයි. විඤ්ඤාණ චිත්ත පරමාර්ථය (89/121) වශයෙන් ද වේදනා, සඤ්ඤා සහ සංඛාර චෛතසික පරමාර්ථය (52) වශයෙන් ද රූප රූප පරමාර්ථය (28) වශයෙන් ද පංචස්කන්ධයෙහි නිෂ්ටාව නිබ්බාන පරමාර්ථය (1) වශයෙන් ද දක්වා ධර්ම 170/202 ක් ඉදිරිපත් කරයි.

**ආශ්‍රේය ග්‍රන්ථ**

*Abhidharmakośa of Vasubandhu*, (1983). Vol. i, Subhara Jha, (1983). trans. & edit. La Vallee Poussin. Patna: Jayaswal Research Institute.

Dutt, N. (1978). *Buddhist Sects in India.* Delhi: Motilal Benarisdass.

Jaini, P. S. (2001). *Collected Papers on Buddhist Studies*, Delhi: Motilal Banarsidass.

McGovern, (1923). *A Manual of Buddhist Philosophy*, Vol. i, London: Kegan Paul Trench Trubner.

Stcherbartsky, F. Th. (1979). *The Central Conception of Buddhism and Meaning of the Word 'Dharma'.* Delhi: Motilal Banarsidass.